ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

පුරප්පාඩු

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ පහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

වෑද්දුම්කරු (Fitter) (PL-2)

බාහිර අයැදුම්කරුවන් සඳහා සුදුසුකම්

(අ) අධ්‍යාපන සුදුසුකම්

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ,යටත් පිරිසෙයින් විෂයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය. සහ ,

(ආ) ශිල්පීය නිපුණතා /ප්‍රවීණතා

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (N.V.Q) දෙවෙනි හෝ තුන්වැනි මට්ටමට ගැළපෙන පරිදි ඉහත තනතුර සඳහා වූ ශිල්පීය නිපුණතා /ප්‍රවීණතා සහතිකය සමඟ වසර 2 කට නොඅඩු පුහුණුව /පළපුරුද්ද ලබා තිබිය යුතුය.

ආරම්භක වැටුප් පරිමාණය :- 2025.04.01.දින සිට PL 2 - 2025 Grade III

රු. 42,300 - 10X490 - 10X540 - 10X590 - 12X630 = 66,060 මීට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ. (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව මෙම වැටුප් තලයේ මූලික අදියර වන රු. 40,008/= හි පිහිටුවනු ලැබේ.)

පොදු

සෑම අයැදුම්කරුවෙකුම,

i. අයැදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

iv. වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය.

v. සේවකයා විසින් සේවක අර්ථසාධක අරමුදළ දායකත්වය 10%ක් දැරිය යුතු අතර සමාගම විසින් ඒ සඳහා 15%ක් දරනු ලැබේ. සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට 3%ක දායකත්වයක් ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම මගින් දරනු ලැබේ.

vi. රාත්‍රී වැඩමුර ක්‍රියාත්මක වේ.

අයැදුම්පත් තමා විසින් ම සකස් කොට සියළු තොරතුරු හා සුදුසුකම් ඇතුළත් කර අදාළ සහතික පත්‍රවල පිටපත් ද සහිතව කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුරේ නම පැහැදිලිව සඳහන් කර අයැදුම්පත් 2026.11.16 වන දිනට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (මෙදිනට පසුව ලැබෙන අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.)

ලිපිනය : ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මානව සම්පත් හා නීති),
ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්,
තැ.පෙ 17, කපුවත්ත, ජා-ඇල.